**මුලටියන ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මුලටියන ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මුලටියන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.433,517 ක ආදායමක් ලැබිය යුතු ආදායම ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර විවිධ තොග අයිතම 09 ක ශේෂය රු.10,272 ක් වැඩියෙන්ද, අයිතම 40 ක ශේෂය රු.151,863 ක් අඩුවෙන්ද ලෙස විවිධ තොගය රු.141,591 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හිඟහිටි වෙනත් ආදායම් ගිණුමේ ශේෂය හා ඊට අදාල උපයෝගී ලේඛණ/උපලේඛණවල දැක්වෙන ශේෂය අතර රු.4,272,150 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.26,896,799 ක් වූ ගිණුම් විෂයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ---------------- | ------------------ | -------------------------- | ----------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය | 2014 වර්ෂයෙන් පසුව කොට්ඨාශ 13 කට අදාලව හඳුනාගෙන තිබුණු මාර්ග 813 ක් ගැසට් මගින් ප්‍රසිද්ධියට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන ආයතනවල භූගෝලීය තොරතුරු ජාලයක් නිර්මාණය කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කරන තෙක් මාර්ග ගැසට් කිරීම නොකරන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 772(1) | භාවිතයෙන් ඉවත් කරන ලද ටයර් 43 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් කමිටුවේ නිර්දේශ මත ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.2,258,639 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.155,125 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| | ------- | ---------- | --------- | --------- | ----------- | ------------- | --------- | -------- | ------------ |
| (i) | වරිපනම් හා බදු | 1,891,205 | 1,535,109 | 1,564,833 | 43,420 | 1,492,200 | 22,889 | 44,354 | 73,144 |
| (ii) | කුලී | 8,923,500 | 7,215,922 | 7,553,006 | 428,157 | 12,459,200 | 3,288,425 | 4,042,085 | 765,241 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 592,050 | 595,161 | 555,161 | 59,450 | 540,200 | 1,508,342 | 1,571,342 | 19,450 |
| (iv) | වෙනත් ආදායම් | 8,784,605 | 5,606,409 | 1,087,617 | 5,290,844 | 12,668,000 | 900,713 | 389,278 | 772,052 |
| | | ------------ | -------------- | -------------- | ------------ | -------------- | ---------- | ------------ | ------------- |
| | | 20,191,360 | 14,952,601 | 10,760,617 | 5,821,871 | 27,159,600 | 5,720,369 | 6,047,059 | 1,629,887 |
| | | ======= | ======= | ======= | ====== | ======== | ====== | ====== | ======= |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වන වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගත් කොට්ඨාශ 04 ක් ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර තිබුණ ද, ඒවායෙන් වරිපනම් බදු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | වරිපනම් තක්සේරු සිදු කිරීම සඳහා ආණ්ඩුකාරවරගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 2 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශය තුළ පැවැත්වෙන ප්‍රසංග වලින් විනෝද බදු අය කිරීමට අදාල විධිවිධාන ගැසට් නිවේදනය මඟින් ප්‍රසිද්ධ කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී දෙයියන්දර බස් නැවතුම භූමියේ පැවති සැණකෙළිය සහ සංගීත ප්‍රසංගය සඳහා විධිමත් පරිදි විනෝද බදු අය කර ගෙන නොතිබුණි. | සැණකෙළිය සහ සංගීත ප්‍රසංගය පවත්වන අවස්ථාවේ මුලටියන ප්‍රාදේශීය සභාව විනෝද බදු පනවා නොතිබූ බැවින් බදු අය කිරීමට අපහසු වූ බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව සතු කඩ කාමර 70 න් 60 ක් බදු දී තිබූ අතර, ඉන් බදුකරුවන් 18 දෙනෙකුගෙන් රු.407,037 ක කඩ කුලී අයවීමට තිබුණි. තවද එම හිඟ ශේෂය තුළ වසා දමා තිබූ කඩ කාමර 10 ක් සඳහා වර්ෂ 2008 – 2013 ක කාල පරාසයට අදාළව බිල්කර තිබූ රු.318,850 ක කඩ කාමර කුලී ඇතුළත්ව තිබුණි. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඈ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 11 ඡේදයේ විධිවිධාන වලින් බැහැරව සභාව සතු වෙළෙඳ සංකීර්ණ 02 ක කඩ කාමර 04 ක් වෙනත් පාර්ශවයන් වෙත අතුරු බදු දී තිබුණි. | වෙනත් පාර්ශවයන් වෙත බදු දී නොමැති බව බදුකරුවන් ප්‍රකාශ කරන බවත්, වාචික ප්‍රකාශ මත පමණක් පදනම්ව බදු දී ඇති බව නිරීක්ෂණය කර ඇති බවත්, සභාව වෙත නිසියාකාරව බදුකරුවන් මාසික කුලී ගෙවන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ලෙහි පිහිටි කඩ කාමර 08 ක සභාවේ අවසරයකින් තොරව කොරිඩෝවද ආවරණය වන පරිදි ඉදිරියට පුළුල් කිරීම හා කඩ කාමර ඇතුලත යකඩවලින් තට්ටුවක් හා එයට පිවිසීමට තරප්පුවක් සකස් කර කඩ කාමර සංකීර්ණයේ සැලැස්මෙන් පරිබාහිරව ඉදිකිරීම් සිදු කර තිබුණි. | 2020 ජූලි 21 දින මු.ප්‍රා.ස.(ඉ) 1 පරිදි සභාවේ අවසරය ලබා දී ඇති බව | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් උසාවි දඩ රු.904,234 ක් හා මුද්දර ගාස්තු රු.12,440,398 ක් අය විය යුතුව තිබුණි. | උසාවි දඩ මුදලින් රු.654,234 ක් හා රු.12,440,398 ක මුද්දර ගාස්තු මුදලින් රු.5,245,766 ක් මේ වන විට අය වී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 ජනවාරි 18 දිනවන විටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව පහත කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>(i) නාගරික නොවන බලප්‍රදේශය තුළ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා ඉඩම් අනුබෙදුම් කිරීම.<br>(ii) ශ්‍රවණාගාරය කුලියට ලබා දීම.<br>(iii) සභාව සතු මුලටියන හා මාකඳුර ක්‍රීඩාපිටි කුලියට ලබා දීම. | ශ්‍රවනාගාරය හා ක්‍රීඩා පිටි කුලියට දීම සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොමැති බවත්, නාගරික නොවන සීමාව තුළ ගොඩනැගිලි සැලසුම් හා ඉඩම් අනු බෙදුම් අනුමත කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථා සකස් කර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමු කළ ද මාතර දිස්ත්‍රික්කයට අදාල වන පරිදි අතුරු ව්‍යවස්ථාවක් සම්පාදනය කර ලබා දෙන බවට දැනුම් දී ඇති බැවින් එය ලබා දුන් පසු ඉදිරි කටයුතු සිදු කරන බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බලප්‍රදේශය තුළ දෛනිකව එක්රැස් වන කසළ ටොන් 01 ත් 02 ත් අතර ප්‍රමාණයක් වූ නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීමට ක්‍රියා නොකර දෙයියන්දර දංහේන ඉඩමේ වළ දැමීමට කටයුතු කර තිබුණි. තවද සභාව විසින් ක්‍රියාත්මක කරන කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | නොදිරන ද්‍රව්‍ය තෝරා වෙන්කර ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන ආයතනයකට යොමු කරන බවත්, අනෙකුත් නොදිරන ද්‍රව්‍ය බිම් පිරවීම සිදු කරනු ලබන බවත්, කොම්පෝස්ට් අංගනයේ අපජලය බැස යාමට අපජල ටැංකියක් ඉදිකිරීම සඳහා කොන්ක්‍රීට් පැඩ් එක සකස් කිරීමෙන් අනතුරුව පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට පියවර ගනු ලබන බව. | විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු වෙළෙඳ සංකීර්ණ 02 ක වහල අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් කඩ කාමර 10 ක් භාවිතයට නොගෙන වසා දමා තිබුණි. | මුලටියන වෙළඳ සංකිර්ණයේ කඩ කාමර 07ක වහලයෙහි පවතින අබලන් තත්වය මත වසා දමා ඇති බවත්, ගැණුම්කරුවකු ඉදිරිපත් නොවීම නිසා මාකඳුර වෙළඳ සංකීර්ණයේ එක් කඩ කාමරයක් වසා දමා ඇති බව. | අලුත්වැඩියාව කඩිනමින් සිදුකර භාවිතයට ගත යුතුය. |
| (ආ) | 2016 සිට 2020 දක්වා ගොඩනැගිලි අයදුම්පත් 156 ක් අනුමත කර සංවර්ධන බලපත්‍ර ලබා දී වසර 03 ත් 07 ත් අතර කාලයක් ගතවී තිබු නමුත් ඉන් ගොඩනැගිලි 43 කට පමණක් අනුකූලතා සහතික ලබා ගෙන තිබුණි. එය අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 28 ක් විය. | පදිංචියට සුදුසු තත්වයට නිම කර ඇති ඉදිකිරීම් සඳහා අනුකූලතා සහතිකය ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා යැවීමෙන් පසු ඔවුන් අනුකූලතා සහතික ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බවත්, එසේ නොකළ ඉදිකිරීම්කරුවන් වෙත සිහිකැඳවීම් යැවීමට කටයුතු කරන බව. | කඩිනමින් අනුකූලතා සහතික ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයකින් 2021, 2022 හා 2023 වර්ෂවලට අදාලව අයවිය යුතු සියයට 1 ක ගාස්තු රු.22,075 ක් අඩුවෙන් අය කර තිබුණි. | 149 වන වගන්තිය ප්‍රකාරව සියයට 1 ක නොඉක්මවන ලෙස සියයට 0.5 ක් ලෙස පනවා 2021 වර්ෂයේ ගාස්තු අය කර ඇති බවත්, 2022 හා 2023 වර්ෂවල සේවා ගාස්තු නිදහස් කළ බැවින් ගාස්තුවේ අඩු වීමක් පෙන්නුම් කළ ද 2024 අප්‍රේල් 01 දින රු.13,359 ක මුදලක් අය කළ බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බලප්‍රාදේශයේ පැවති තෙල් මෝලක් සඳහා 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගෙන නොතිබූ අතර, 2022 ඔක්තෝබර් 12 දින පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීම සඳහා අනුමත ගොඩනැගිලි සැලැස්මද ඉදිරිපත් කිරීමට දැනුම් දී තිබුණද ගොඩනැගිලි සැලැස්ම ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූණි. | අදාල ගොඩනැගිල්ලේ සැලැස්ම අනුමත කිරීමට කටයුතු සිදු කරන ලෙස එහි අයිතිකරු දැනුවත් කිරීමට කටයුතු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 28(1) වගන්තියේ විධිවිධාන වලින් බැහැරව සංවර්ධන බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව ඉදිකර අවසන් කර තිබූ හෝ ඉදිකරමින් පැවති ඉදිකිරීම් 06 කින් 03 කට සංවර්ධන බලපත්‍ර ලබාදීම සඳහා සැලසුම් කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කර නොතිබූණු අතර, ඉදිකිරීම් 03 කට අදාලව සංවර්ධන බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර නොතිබුණි. | එම ඉදිකිරීම්කරුවන් දැනුවත් කර මුලික කටයුක්ත ලෙස ඉඩම් අනුමත කිරීමේ ක්‍රියාවලියට යොමු කර ඇති බවත්, ඔවුන් එය මග හැරීමට කටයුතු කලහොත් අනවසර ඉදිකිරීම් ලෙස සලකා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෘත්තීය සමිති සම්මේලනයක් සඳහා සහභාගි වන නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් පෞද්ගලික පාර්ශවයන්ට ගෙවීම් කිරීමට නෛතික ප්‍රතිපාදනයක් සලසා නොතිබියදී 2023 ජූලි 29 දින මඩකලපුව සර්වෝදය මධ්‍යස්ථානයේ දී පැවති පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සංගමයේ 2023 වර්ෂයේ වාර්ෂික සම්මේලනයට සහභාගී වීම සඳහා ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් 08 දෙනෙකුට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් රු.101,600 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | 2023 ජුනි 20 දිනැති දකුණු පළාත් ආණ්ඩුකාරවර විසින් ලබා දී තිබූ අනුමැතියට යටත්ව මාතර දුම්රිය ස්ථානය වෙතින් ලබා ගත් මිල ගණන් මත පදනම්ව ගෙවීම් සිදු කර ඇති බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| රු.99,446,851ක වටිනාකමකට ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් කැඳවීම මගින් රු.20,855,246 ක ගිවිසුම්ගත මුදලකට කොන්ත්‍රාත් පිරිනමා තිබූ කර්මාන්ත 04 ක කොන්ත්‍රාත්කරුවන් විවිධ හේතු දක්වමින් නියමිත ගිවිසුම් කාලය තුළ කොන්ත්‍රාත් ඉටු නොකර තිබියදී වෙනත් බාහිර හේතු මත ඉදිකිරීම් අතරමග නතර වී තිබීමෙන් ඉදිකර තිබූ කොටස් විනාශ වෙමින් පැවති අතර බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. තවද නියමිත ගිවිසුම්ගත කාලය තුළ කොන්ත්‍රාත් ඉටු නොකළ කර්මාන්තකරුවන්ගේ කාර්යසාධන ඇපකරය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කර්මාන්ත කර ගෙන යන අතරතුර කොන්ත්‍රාත්කරුවන්ට වෙනත් බාහිර ගැටළුවලට මුහුණදීමට සිදුවීමත්, ඉන්ධන හිඟය හා අමුද්‍රව්‍ය හිඟය පැවතීමත්, 2021 වසරේ සිදු කරන ලද කර්මාන්ත සඳහා රජය විසින් ඊළඟ වර්ෂයේ ප්‍රතිපාදන ලබා නොදීමත් නිසා මාකඳුර වෙළඳ සංකීර්ණය ඉදි කිරීම, දෙයියන්දර මාළු ලැල්ල | ඵලදායී ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ඉදිකිරීම හා ප්‍රාදේශීය සභාවේ ගරාජය ඉදිකිරීම යන කර්මාන්තවල ඉදිකිරීම් අතරමග නතර කරන ලද බව හා දෙයියන්දර වෙළඳ සංකීර්ණය ඉදිකළ බව. | |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රාථමික සේවා කාණ්ඩයට අයත් තනතුරු 05 ක් සඳහා අනුමත සේවක සංඛ්‍යාව සම්පූර්ණ කර තිබියදීත් දෛනික හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 09 දෙනෙකු බඳවා ගෙන නියමිත රාජකාරී වලින් පරිබාහිරව රාජකාරී පවරා තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ හා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව සේවා අවශ්‍යතාවය මත බඳවා ගෙන ලිඛිත රාජකාරි පවරා ඇති බව. | තනතුරට අදාල රාජකාරි පැවරිය යුතුය. |